## කවි කොළය

# පචෝරිස් වන්නම!

සසර සරන සතට පබල - ඇමති පුටුව ලැබුණු කලට
ගතද ඇතුගෙ සිරුර විලස - මහත් වී යතා

සිරස ගතට ගිළුණු ලෙසට - බලන අයට පෙනෙයි කැතට
තබන තබන පියෙන් පියට - පොළව සෙලවෙතා

ගෙලට දමන උතුරු සළුව - තැනට කලට ඔබින ලෙසට
නිලට, රතට, කොළ පැහැයට - දමයි ඒ තුමා

අඳින ඇඳුම සුදුම සුදුය - පපුව ගලකි නැත තෙතමන
එහෙම වුවද රුවැති කතට - (දුටුවිට) උණු වෙලා යතා

ඔහුට වැඩිය අති බිහිසුණු - බෝම්බයකි ඔහුගෙ බිරිය
පෙනුම හොඳය, හිත දරුණුය - ඇමති බවලතා

මොළය නොමැති ඇමති පුතුද- මහම මහම මගෝඩියෙකි
පොලිසියටද චලෙන්ජ් කරන - ඔහුය බලවතා

දෙපස සිටින අයට වඳින - කපටිකමට ඔලුව නවන
විකට රජෙකු ලෙසට පෙනෙන - පචෝරිස් තුමා

සතුරු අයට මරු කැඳවන - මිතුරුකමට තනතුරු දෙන
කපටි පොරකි, රටට බරකි - ඇමති සංගුරා

පහත හෙළම් මම බඩුමිළ- නොකළහොතින් හෙට අස්වෙමි
කියන නමුදු කිසිම විටක - නොයන අස්වෙලා

අතට පයට මෙහෙකරුවොද - බොඩිය රකින ගාඩ්වරුද
වන්දි භට්ට ගායකයොද - සිටිති පිරිවරා

අඹුගෙ ගෙදර ලගින නමුදු - කුලී නිවැසියෙකි කියමින
හොරට ගෙවල් කුලිය ලක්සෙ - බැගින් ලබමිනා

චන්ද කාලෙ ගමට වඩින - කොන්ද නවන් අපට වඳින
දින්න දාට මග හැරයන - චන්ඩි මල්ලියා

බුරුතු පිටින් ගොස් පිටරට - දුවගෙ උපන්දින සමරණ
අපට එවන හෝටල් බිල - ගෙවන්නට කියා

මොළය තියන දාට බලය -
බලය තියන දාට මොළය
නොමැති මෙවැනි පුදුම සතෙක් -
ලොවේ වෙන නැතා

ගැහිලි ගහන , සැපට ගරන-
වසර පහෙන් පැන්ෂන් යන
බලනු මැනවි ඇමති පොරක් -
(යනහැටි) බඩ ගෙඩිය වනවනා



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



## Polce reveals that the hunger striker secretly ate burger Big Macs
## බිග්මැක් කකා කළ මාරාන්තික උපවාසය



**Parameswaran Subramaniyan said he would fast unto death**

Parameswaran Subramaniyan pretended to go without food for several weeks in protest of the Sri Lankan Government's treatment of the Tamil minority but surveillance footage revealed the 28-year-old had given into temptation, the Daily Mail reports. Specialist monitoring teams in Scotland Yard caught him eating the McDonalds hamburgers - but police decided against arresting him out of fear it would start a riot.

Police officers were guarding Subramaniyan and another hunger striker for their own protection for the length of their protest, at an estimated cost of around $12 million.

"In view of the overtime bill, this has got to be the most expensive Big Mac ever," a police insider told the Daily Mail. But Subramaniyan has denied tucking into Big Macs, saying the report is a "conspiracy to defame the Tamil struggle".

පසුගිය ජුනි මාසයේ ලන්ඩනයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව අසළ පැවති ද්‍රවිඩ උද්ඝෝෂණයේදී 'මැරෙනතුරු' බඩගිනි උපවාසයක් ඇරඹූ **පරමේස්වරන් සුබ්‍රමනියම්** නමැති දෙමළ කොටි සාමාජිකයා හොර රහසේ මැක්ඩොනල් හැම්බර්ගර් ගෙන්නවා ගෙන කෑබව ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය අනාවරණය කරයි. කොටියා කළ මෙම මහා වංචාව පොලිස් පරීක්ෂණ කැමරාවට මනාසේ සටහන්වූ නමුත් ඒ දැක බ්‍රිතාන්‍ය පොලීසිය ඔහු අත්අඩංගුවට නොගත්තේ උද්ඝෝෂකයින් පොලීසිය සමග ගැටී කලබලයක් ඇති කරා විය යන කල්පනාව ඇතිවූ නිසා යයි පොලීසිය පවසයි. පොලීසියේ කතාව අසත්‍යයක් බව කොටි කියති. කෙසේවුවද එම උද්ඝෝෂණයට බ්‍රිතාන්‍ය රජයට වූ වියදම පවුම් මිලියන 8 කි. ජනතාව කියන්නේ කොටි සුපුරුදු පරිදි බ්‍රිතාන්‍ය රජය ගොනාට ඇන්දවූ බවයි.



## Super Scooby is UK's 'biggest burger'
## සුපර් බර්ගර් රාජයා

By JO STEELE

It's made up of four beefburgers, eight rashers of bacon, eight slices of cheese, 12 onion rings and three types of relish. Containing an artery-busting 2,645 calories, the 'Super Scooby' has been dubbed Britain's largest and most fattening burger.

Its creator, cafe owner Nick Lomvardos, is convinced it is impossible to consume the meal in one sitting. In fact he's so sure he's offering a free can of diet cola to anyone who can 'beat the beast'.

The £10 burger, on sale at the Jolly Fryer in Filton, Bristol, stands 15cm (6in) tall and weighs in at 1.5kg (3lb 4oz) - the same as a family-sized roast chicken. The meal contains 145 more calories than a man should consume in an entire day

මහා බ්‍රිතාන්‍යයේ මෙතෙක් සාදා අළෙවියට තැබූ විශාලතම බර්ගරය මෙය බව කියති. මෙම බර්ගරය තුළ බීෆ් බර්ගර් හතරක්ද, බේකන් පටි අටක්ද, විශාල චීස් පෙති අටක්ද, ලූනු පෙති දොළහක්ද ඇත. මේ එකක කැලරි 2645 කි. එය සාමාන්‍ය යෙන් එක් පුද්ගලයෙකුට මුළු දවසේ සියළුම ආහාරවලින් ශරීරයට එකතුවන කැලරි ප්‍රමාණයට වඩා කැලරි 145 ක් වැඩිය. මෙය පුද්ගලයෙකුට තනිවම කෑ නොහැකි තරම් විශාලය. මේ බර්ගරයේ මිළ පවුම් 10 යකි. එය උසෙන් අඟල් 6 ක් ද, බරෙන් රාත්තල් 3 ක් ද වේ. අලෙවි කෙරෙන්නේ බ්‍රිස්ටල් නගරයේ අවන්හලකය.

මෙම සුපර් බර්ගර් රාජයා රසවත්කම කෙසේ වෙතත් ශරීරයට අතිශයින් අහිතකර කෑමක් ලෙසත්, පාරිභෝගිකයාගේ සෞඛ්‍යයට තර්ජනයක් ලෙසත් බොහෝ දෙනාගේ පිළිගැනීම වී ඇත. එසේම මේද සත්ව තෙල් වලින් පිරුණු මෙය හෘදයා බාධ ඇතිකරන උපක්‍රමයක් බවත් මෙවැනි අහිතකර ආහාර තහනම් කළයුතු බවත් සමහරු කියති.



**ඉරිදා** - ලංකාවෙ ඉන්න ළමයින්ට දැන් ලෝකෙ ඕනම
**SUN** රටක යුනිවර්සිටි එකකට ගිහිං ඉගනගන්න පහසුකම් හදල දෙන්න පුළුවන් කියලා පත්තරවල, වෙබ්සයිට් වල, දැන්වීම් දාලා. තාප්ප බිත්ති වල, පොල්ගස්වලත් යෝධ බැනර් ගහලා. ඒවයෙ පින්තූරවල ඔක්කොම ඉන්නෙ සුදු උපාධි ලෝගු දාගෙන ඉන්න සුදු තරුණ තරුණියො. මාදිවෙල තේ කඩේක බිත්තියෙත් ගහලා තියනවා එංගලන්තෙ කේම්බ්‍රිජ් යුනිවර්සිටි එකට ඇතුල් වීමේ ඉල්ලුම්පත්තර මෙහි ඇත කියලා. නොයෙල් අයියා ගිහින් මුදලාලි මේක ඇත්තක්ද කියලා කඩකාරයගෙන් ඇහුවම කිව්වලු," ඇත්තෙයි කියන්නෙ මහත්තෙයො, විස්වාස කරන්න, මේ කඩේ වැඩට හිටපු අර හොරොව්පතානෙ කොළුවා මෙතනින්ම ඇප්ලිකේෂන් එකක් අරගෙන දාලා, අන්න දැන් යසට එංගලන්තෙ ගිහිං විස්ව විද්‍යාලෙක ඉගන ගන්නවලු. ඌ ගියයින් අම්මපා මටයි පාඩු වුණේ. දැන් තේවතුර ගහන්න, පාන් වලට පිටි අනන්නයි එකෙක් මට නැතිවුණා."

**සඳුදා** - කැතරින් නැන්ද කියනවා යුද්දෙ දිනූ දා ඉඳලා
**MON** අළුත් දේශප්‍රේමියො සෑහෙන්න බෝවෙලයි කියලා. ඒ ගොල්ල තමයි දැන් හිතට අරගෙන බැහැලා වැඩ කරන්නෙ. යුද්දෙ තියන කාලෙ ඒ ගොල්ල කොහෝ හිටියද කියලා කවුරුවත් දන්නෙ නැහැ. කතා කරන්නෙ හරියට ඒ ගොල්ල ගිහිං ප්‍රභාකරන් අල්ල ගත්ත වගේය කියලා නැන්දා කියනවා. මං නැන්දට කිව්වා ලංකාවෙ විතරක් නෙවෙයි, මේ එංගලන්තෙත් එහෙම තමයි කියලා. කොටිය විනාස කරන්න මේ කපේදි බැහැයි කියලා නොපිටටම කතාකරපු ඇයො දැන් කියනවා හමුදාවට මල් තියලා වඳින්න ඕන කියලා. එහෙම කිව්වට නම් කමක් නෑ. හැබැයි හෙට ආයිත් කොටියට පක්ෂව කතාකරාවි. හමුදාවට බනීවි

**කුජදා** -මේකත් මම ලංකාවට කතාකරපු වෙලාවෙ දැන
**TUE** ගත්තෙ. දැන් ලංකාවෙ හොරකම් වලට මොබයිල් ටෙලිපෝන් පාවිච්චි කරන හැටි. පොල් කඩන්න වගේ මිනිස්සු ඇවිත් පොල්ගහට ගිහිල්ලා ගහේ මුදුනෙ ඉඳලා වටපිට ගෙවල් වල විස්තර මොබයිල් එකෙන් දෙනවලු හොරාට. " ඔය රතු තාප්පෙ තියන ගෙදර අය දැන් ගමනක් ගියා. කෙළවරේ ගෙදර උඩ ජනේලෙ ඇරලා තියෙන්නෙ. ඒගෙදර බල්ලො නෑ. උළු ගෙදර කට්ටිය දැන් එළියට ගියා, ඉස්සරහ දොරේ යතුර අර ලොකු මල්පෝච්චිය යට හංගලා......" ඔය ආදී විදියට ගෙට පනින විස්තර. ඔන්න ලංකාවෙ දියුණුව.

**බුදදා-** ශීලක්කා දුවයි දුවගෙ දරුවොයි බලන්න ලංකාව
**WED** ට ගිහිං ඇවිල්ලා පෙරේදා මට හම්බ වුණා. ලංකා වෙදි මදුරුවෙක් කාලා එයාගෙ කකුල පොඩ්ඩක් රතු වෙලා කහන්න අරගෙන තුවාල වෙලා. මේ තුවාලෙට ප්ලාස්ටර් කෑල්ලක් හොයලා දාන්න හදනකොට දුව කිව්වලු, අම්මේ යං නර්සිං හෝම් එකට, එතන ඔක ටක් ගාලා සනීප කරාවි කියලා. ප්‍රයිවට් ඉස්ප්‍රිතාලෙකට ගෙනිහිං නවත්තලා. දවස් හතරලු හිටියෙ, රුපියල් හැත්තෑපන්දාහක් ගෙවන්න වෙලා. ඒත් තුවාලෙ තවම එහෙමමයි. එයා කියනවා, ඔන්න ළමයො ලංකාවෙ අද දවසෙ තත්වෙ, එහේ යනව නං ලෙඩ වෙන්න හිතාගෙන නම් යන්න එපා කියලා. ඒ කතාව සම්පූර්ණ ඇත්ත.

**ගුරුදා -** මේත් ලංකාවෙ ලෙඩ සහ බෙහෙත් ගැන තව
**THU** පැත්තක්. කවුද වෙද මහත්තයෙක් ඕනම අසාධ්‍ය ලෙඩකට සතියකින් ගුණ දෙන මහා තෛල රාජයා, මෙය දිව්‍යඖෂධයකි, කියලා පත්තරේ දැන්වීමක් දාලා. මේ තෙලෙන් හැන්දක් බීපු ගමන් ලෙඩ හොඳ වෙනවා කියලා ඒ බීපු අය කියන සැටිපිකට් ගොඩකුත් පත්තර වල ගිහිං. ඒක අහල දැන් මිනිස්සු පිස්සුවෙන් වගේ මේ තෙල් කොහේද තියෙන්නෙ කියලා හොයනවා. සමහරු නාවින්නෙ ආයුර්වේද මධ්‍යස්ථානෙට ගිහිං තෙල් ඉල්ලලා. එතනින් කියලා "අපි ළඟ එහෙම තෙලක් නැහැ" කියලා. ඒ ආපු මිනිස්සු කියනවලු "නැහැයි කියලා හරි යන්නෙ නැහැ, බෝතලයක් නැතත් දෙන්නකො අනේ තෙල් කාලක් හරි " කියලා. යන්නෙ නැතුව එතනට වෙලා ඉන්නවලු. මේ මිනිස්සුන්ට දොස් කියන්න, හිනා වෙන්න නරකයි. ඇපලෝ ඇතුළු තැන් හිසේ ඇම්මටත් රුපියල් ලක්ෂ ගණනින් හූරගෙන කද්දි මිනිස්සු වෙන මොනව කරන්නද? කාගෙ පිහිටද? ආණ්ඩුව ගැන ඒකෙ සෞඛ්‍ය ඇමති ගැන කතාකරලා වැඩක් නෑ.

**කිව්දා-** එංගලන්තෙ පුරා තැපැල් වර්ජනයක් දැන් මාස
**FRI** ගණනක් ලියුම් එන්නෙ නෑ. තලවකැලේ නැන්දම්මා ගිය මාසෙ අපිට බලන්න කියලා මුණුපුරාගෙ පළවෙනි උපන්දිනේ පොටෝ එව්වලු තවම ආවෙ නෑ. එංගලන් තෙට ගිය කලක්. ලෝකෙ ඉස්සෙල්ලම තැපැල් සේවය පටන්ගත්තු රට එංගලන්තෙ. ඉස්සෙල්ලම ලියුමක් බෙදපු රට එංගලන්තෙ. අද ලෝකෙම තැපැල් සේවය දියුණු වෙලා. ඒක පටන්ගත්තු රටේ ලියුම් බෙදීම නතර වෙලා. රවියි, තාන්යා දෙන්නා, පුතත් අරන් ලංකාවෙ පදිංචියටම යනවයි කියලා කිව්වා. ඒක හොඳ අදහසක්. මොනව වුනත් ඒ අපේ රට. මම ඒ දෙන්නට සුබපැතුව.